සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

## කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ

# විකසිත - 2025

(5 ශ්‍රේණිය සිසුන් සඳහා විභව්‍යතාමාන ඇසුරෙන් සැකසූ මාසික ඇගයීම් වැඩසටහන - අංක 02)

**පැය එකයි**

විභාග අංකය / නම - ............................................................ශ්‍රේණිය - .............

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස් -**


- ඔබේ **විභාග අංකය/ නම** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය/නම** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| **අවසාන ලකුණු** | |
| **ඉලක්කමෙන්** | |
| **අකුරෙන්** | |

| | කෙටි අත්සන හා සංකේතය |
|---|---|
| පළමු පරීක්ෂක | |
| ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බවට සහතික කරමි. | V/I/S |
| දෙවන පරීක්ෂක | |
| පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බවට සහතික කරමි. | V/I/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/I/S |
| ප්‍රධාන පරීක්ෂක | |
| අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය. | V/I/S |

- **රූපය ඇසුරෙන් 1, 2 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




01. A හා B හි වාසය කරන සතෙකු නොවන්නේ

1. කුකුළා 2. කිඹුලා 3. තාරාවා

02. B, C හා D හි වාසය කරන සතෙක් වන්නේ

1. මාළුවා 2. හංසයා 3. ගිරවා

03. පහත දැක්වෙන රූපය නිරීක්ෂණය කරන්න. ඒ ඇසුරින් දී ඇති A, B හා C වගන්ති ඇසුරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.



A. මෙහි තිදෙනෙක් සිටගෙන සිටිති.

B. ගැහැනු ළමයා යමක් කමින් සිටියි.

C. ඔවුහු එළිමහනක සිටිති.

1. C පමණි 2. A හා C ය 3. A සහ B ය

04. අනුපිළිවෙළින් දක්වා ඇති අවස්ථා වන්නේ,

1. පුරසඳ , අමාවක , අවඅටවක , පුරඅටවක
2. පුරඅටවක , අමාවක , පුරසඳ , අවඅටවක
3. පුරඅටවක , පුරසඳ , අවඅටවක , අමාවක

05. සංඛ්‍යා රටාවෙහි හිස්තැනට ආ යුතු සංඛ්‍යාව වන්නේ,

| | | |
|---|---|---|
| | 1 | |
| 4 | 34 | 2 |
| | 3 | |

| | | |
|---|---|---|
| | 2 | |
| 4 | 59 | 3 |
| | 2 | |

| | | |
|---|---|---|
| | 3 | |
| 5 | … | 4 |
| | 1 | |

1. 120 2. 47 3. 73

06. මෝටර් රථයක් ඉන්ධන ලීටර් 1 කින් 12km දුරක් ගමන් කරයි. ගමනක දුර 240km වේ. එම ගමනින් අඩක් ගමන් කර ආපසු ඒමට අවශ්‍ය වන ඉන්ධන ප්‍රමාණය කොපමණ ද?

1. 12 $l$ 2. 20 $l$ 3. 24 $l$

07. මාර්තු මාසයේ මැද ඉරිදා දවසක් නම් එම වසරේ ම ජුනි 25 දවස කුමක් ද?


1. අඟහරුවාදා 2. බදාදා 3. බ්‍රහස්පතින්දා

08. එක්තරා පරීක්ෂණයකට ළමුන් 10 ක් ඉදිරිපත් වූ අතර එක් අයෙකුට ලැබෙන කාලය මිනිත්තු 10 කි. එකවර මෙම සියලු ළමුන් පරීක්ෂණයට යෙදවුයේ නම් පරීක්ෂණය අවසන් කිරීමට ගතවන සම්පූර්ණ කාලය වනුයේ,

1. පැය 1 මිනිත්තු 40 2. මිනිත්තු 100 3. මිනිත්තු 10

09. ඍජුකෝණාස්‍රාකාර මල් පාත්තියක දිග 12m වේ. පළල ඉන් ½ ක ප්‍රමාණයකි. එම පාත්තිය වටා මීටර 2 න් 2 ට සමාන දුරින් සිටුවීමට කණු කීයක් අවශ්‍ය ද?

1. 18 2. 12 3. 19

10. 

මෙම රූපයෙන් ¾ ක් පාට කිරීම සඳහා, (පාට කර ඇති කොටස් සමගම ඊට අමතරව) තව කොටස් කීයක් පාට කළ යුතු ද?

1. 4 2. 6 3. 8


11. 21 වන සියවසෙහි 6 වෙනි දශකයට අයත් වර්ෂ දෙකක් වන්නේ,

1. 2050 - 2060 2. 2050 - 2054 3. 2058 - 2060

12. ගොළුබෙල්ලෙක් මීටර 48 ක් උස ගසක් දිගේ ඉහළට බඩගාගෙන යයි. ගොළුබෙල්ලා මීටර 8 ක් ඉහළට ගිය විට නැවත මීටර 3 ක් ආපස්සට එයි. එසේ නම් ගොළුබෙල්ලාට ගසෙහි ඉහළට ම නැගීමට කොපමණ වාර ගණනක් උත්සාහ කළ යුතු ද?

1. 7 වරක් 2. 9 වරක් 3. 10 වරක්

13. මෙහි ඇත්තේ මැජික් මලකි. මෙම මලින් පෙත්තක් කැඩූ විට ඉතිරි පෙති දෙගුණයක් වේ. දෙවන අවස්ථාවේ දී පෙත්තක් කැඩූ විට ඉතිරි පෙති දෙගුණයක් වේ. මේ ආකාරයට හතරවන අවස්ථාවේ දී පෙත්තක් කැඩූ විට එයට ලැබෙන පෙති ගණන කීය ද?



1. 18 2. 34 3. 66

14. පන්ති කාමරයක පුටු 3 බැගින් පේළි 12 ක් ද, පුටු 4 බැගින් පේළි 6 ක් ද ඇත. එයින් පුටු යම් කිසි ප්‍රමාණයක් ඉවත් කළ පසු, පුටු 45 ක් ඉතිරි විය. ඉවත් කළ පුටු ප්‍රමාණය කීය ද?

1. 15 2. 20 3. 60

15. එක ළඟ පිහිටි ඔත්තේ සංඛ්‍යා 5 ක එකතුව 105 කි. එහි මුල සහ අග සංඛ්‍යා දෙකෙහි එකතුව වන්නේ,

1. 21 2. 36 3. 42

16. පහත රෝම සංඛ්‍යා අතුරෙන් කැඩපතින් බැලූ විට රෝම සංඛ්‍යාවේ අගය වැඩි වී පෙනෙන්නේ කුමන අංක ද?


1. iv , ix 2. vi , xi 3. xi , x

17. ප්‍රශ්න පත්‍රයක ඇති මුළු ප්‍රශ්න ගණන 20ක් වන අතර මුළු ලකුණු ගණන 100 කි. වරදින සෑම පිළිතුරක් සඳහා ම ලබා ගත් ලකුණුවලින් ලකුණු 2 ක් අඩුවෙයි. නිවැරදි පිළිතුරු ගණන 13ක් නම් ළමයා ලබා ගත් ලකුණු ගණන කොපමණ ද?

1. 44 2. 51 3. 58


18. A සහ B යනු ඔරලෝසු 2 කි. A ඔරලෝසුවෙහි පැය 1 කට මිනිත්තු 5 වැඩියෙන් ද B ඔරලෝසුවෙහි පැය 1 කට මිනිත්තු 3 ක් අඩුවෙන් ද වේලාව ගමන් කරයි. පෙ.ව. 8.00 ට ඔරලෝසු දෙකෙහි ම නිවැරදි වේලාව සකසයි. ප.ව. 1 ට මෙම ඔරලෝසු දෙකෙහි දැක්වෙන වේලාවන් අතර වෙනස වනුයේ,

1. මිනිත්තු 40 2. මිනිත්තු 45 3. මිනිත්තු 50



19. 

විශාල සෘජුකෝණාස්‍රයේ ඇති සමචතුරස්‍ර ගණන කීය ද?

1. 12 2. 18 3. 20

20. 

මෙම ඝනවස්තුව කඩ ඉරි දිගේ කැපූ විට ලැබෙන පහළ කොටසේ මුහුණතේ හැඩය,

1.  2.  3. 

21. නිම් ඇඳුම් වෙළඳසැලක නිම් ඇඳුම් පිළිබඳව ඇති සංකේත පහත අයුරු වේ.

**වැඩියි ⟵ අඩුයි** **ළමා ඇඳුම් ⟶ වැඩිහිටි ගැහැනු ඇඳුම්**

**අඩුයි ⟶ වැඩියි** **ළමා ඇඳුම් ⟵ වැඩිහිටි පිරිමි ඇඳුම්**

මේ අනුව වැඩිපුර ම ඇති ඇඳුම් වර්ගය වනුයේ,

1. වැඩිහිටි ගැහැනු ඇඳුම් 2. වැඩිහිටි පිරිමි ඇඳුම් 3. ළමා ඇඳුම්

22. කෙටි කතා පොතක් කියවීමේ දී සස්ලිනි පළමු දිනයේ දී පිටු 4 ක්ද දෙවන දිනයේ දී පිටු 8 ක් හා තෙවන දිනයේ දී පිටු 12 ක් ආදී වශයෙන් රටාවකට යම් පිටු සංඛ්‍යාවක් කියවීමේ නිරත වෙයි. කෙටි කතා පොතේ පිටු 112 ක් ඇත්නම් කෙටි කතා පොත කියවා අවසන් කිරීමට දින කීයක් ගතවේ ද?

1. 24 2 . 07 3. 28

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය

23. A සහ B නගර දෙක අතර දුර 10km වේ. අමිල A සිට B දෙසට පැයට 3km වේගයෙන් ගමන් කරයි. අරුණ ඒ මොහොතේ ම ආරම්භ කොට B සිට A දෙසට පැයට 2km වේගයෙන් ගමන් කරයි. ඔවුන් දෙදෙනා මුණ ගැසෙන්නේ B සිට කොපමණ දුරකින් ද?


1. 6 km  2. 4 km  3. 2 km

24. නිවාසාන්තර ක්‍රීඩා උළෙලක මීටර 100 දිවීමේ තරගයක් පිළිබඳව පහත ප්‍රකාශ පරීක්ෂා කර නිවැරදි පිළිතුර තෝරන්න.

- ✷ **අවසානයට තරගය නිම කළේ තමරු ය.**
- ✷ **බිසන්ට පෙර තරග අවසානයට හිරුණ පැමිණියේ ය.**
- ✷ **තරගයට තරගකරුවෝ 6 ක් සහභාගි වූහ.**
- ✷ **තරගයේ ජයග්‍රාහකයා හිරුජ ය.**

1. අවසන් හා ජයග්‍රාහක තරගකරුවා අතර සිව්දෙනෙකු සිටිති.
2. බිසන් තරගය නිමකළේ පස්වෙනියාට ය.
3. හිරුණ තරගය නිම කළේ දෙවෙනියා ලෙස ය.

25.




**1** ඉලක්කමට විරුද්ධ පැත්තේ ඇත්තේ,

1. 3  2. 4  3. 6




26. විශ්ව තමා ළඟ ඇති මුදලින් ½ ක් ඇඳුම් ගැනීමට වියදම් කළේ ය. ඉන්පසු ඉතිරි මුදල සමාන කොටස් 4 කට බෙදා එයින් එක් කොටසක් පොත් මිල දී ගැනීමට වියදම් කළේ ය. විශ්ව පොත් මිල දී ගැනීමට වියදම් කළ මුදල රු. 500 ක් නම් ඇඳුම් ගැනීමට වියදම් කළ මුදල නිවැරදි ව දැක්වෙන පිළිතුර වනුයේ,

1. රු. 2000.00  2. රු. 1000.00  3. රු. 4000.00

27. 4502 ට සමාන වන්නේ කුමක් ද?

1. (45 x 100) + (10 x 2)
2. (4 x 100) + (10 x 5) + (1x2)
3. (45 x 100) + (1 x 2)


28.


|  |  |  |
|---|---|---|
| රු. 720.00 | රු. 850.00 | රු. 930.00 |


අඹ ගෙඩියක මිල වනුයේ,

1. රු. 320.00 2. රු. 160.00 3. රු. 220.00

29. රූපයේ දැක්වෙන M නමැති නැති රෝදය ඊතලයෙන් පෙන්වා ඇති දිශාවට කරකැවූ විට A, B හා C දැති රෝදය කරකැවෙන නිවැරදි දිශාව ඇතුළත් පිළිතුර තෝරන්න.





1. 

2. 

3. 



30.




1. 850 2. 800 3. 1100

31. ළමයින් සමූහයක් ශාලාවක සිටිති. ඔවුන් තිදෙනා බැගින් , හතර දෙනා බැගින්, පස් දෙනා බැගින් සහ හය දෙනා බැගින් යන ආකාර 4 ට ම අනුව කාණ්ඩ කර බලන ලදී. සෑම අවස්ථාවකදී ම ළමයි දෙදෙනා බැගින් ඉතිරි වේ. ළමයි සමූහයේ සිටි ළමයින් ගණන විය හැක්කේ,

1. 52 2. 62 3. 67

32. 

සනක සමූහයක් යොදා ගනිමින් මේසයක් මත විශාල සනකයක් ගොඩනගා ඇත. මෙම විශාල සනකයේ පිටතින් බැලූ විට කිසිදු පැත්තක් පිටතට නොපෙනෙන කුඩා සනක කීයක් තිබේ ද?

1. 2 2. 1 3. 9

33. වාර විභාගයක දී සිසුන් තුන්දෙනෙක් විෂයන් 4 කට ගන්නා ලද ලකුණු පහත වගුවේ දැක්වේ. වගුවේ ඇති සංකේතවලට අදාළ ලකුණු පහත පරිදි වේ.

⊙ - 90 ට වැඩි ◈ - 70-79 අතර ○ - 80-89 අතර △ -70 ට අඩු

| | **මව්බස** | **ගණිතය** | **පරිසරය** | **ආගම** |
|---|---|---|---|---|
| ගයනි | ◈ | △ | ⊙ | ○ |
| ජනනි | ⊙ | ○ | ○ | ○ |
| නිපුනි | ○ | ⊙ | △ | ○ |

මේ අනුව වැඩිම ලකුණු ප්‍රමාණයක් ගත් ළමයා වනුයේ,

1. ගයනි 2. ජනනි 3. නිපුනි

34. එක්තරා කම්බියකින් පැත්තක දිග 5cm ක් වූ සමචතුරස්‍රයක් සාදන ලදී. මෙම කම්බියට සමාන වූ තවත් කම්බියකින් 6cm දිග වූ සෘජුකෝණාස්‍රයක් සාදන ලදී. මෙම සෘජුකෝණාස්‍රයේ පළල සෙන්ටිමීටර කීය ද?

1. සෙන්ටිමීටර 4 2. සෙන්ටිමීටර 3 3. සෙන්ටිමීටර 5

35. විභාගයක් සමත් වූ සිසුන් පිරිසක් එකිනෙකා අතර එක් වරක් බැගින් අතට අත දෙමින් සුබ පතා ගත්හ. මොවුන් අතට අත දුන් මුළු වාර ගණන 45 නම් විභාගය සමත් වූ සිසුන් ගණන කොපමණ ද?

1. 9 2. 10 3. 11

36. මීටර 300 ක වට ප්‍රමාණය සහිත වෘත්තාකාර පිට්ටනියක් වටා 15m න් 15m ට කොඩි කණු සිටුවා කොඩි එල්ලීමට තීරණය කර ඇත. ඒවා පිළිවෙළට රතු, නිල්, කොළ යන වර්ණවලින් යුක්තවේ. එහි පළමු කණුවෙහි ඇති කොඩිය රතු වර්ණයෙන් යුක්ත වේ නම් අවසාන කණුවෙහි ඇති කොඩියෙහි වර්ණය කුමක් ද?

1. රතු 2. කහ 3. නිල්

37. ''නැගෙනහිර අහස චමත්කාර කරමින් හිරු බැස යාමට සුදානම් වෙයි'' මෙම ප්‍රකාශය වැරදි ය. එම ප්‍රකාශය වැරදි වන්නේ,

1. හිරු බැසයන විට අහස චමත්කාරයෙන් බැබළෙන්නේ නැත.

2. අහසට කිසි විටෙකත් බැබළිය නොහැක.

3. නැගෙනහිරින් හිරු බැස යන්නේ නැත.

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය


38. දේවිකා අත රුපියල් 5 කාසි හා රුපියල් 2 කාසිවලින් රුපියල් 68 ක් ඇත. ඇය සතුව තිබිය හැකි රුපියල් 2 කාසි ගණන විය හැක්කේ,

1. 2
2. 7
3. 4

39. බල්බ වැලක කොළ , රතු , දම් යන අනුපිළිවෙළින් බල්බ අමුණා ඇත. එහි බල්බ 65 ක් තිබුණි නම්, එක් එක් බල්බවලින් තිබිය හැකි බල්බ ගණන පිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,

1. 21 , 22 , 23
2. 22 , 22, 21
3. 21 , 21 , 22

40. පහත දැක්වෙන්නේ ඝනකාභ 15 ක් එකිනෙක මත තනි රූපයක් ලැබෙන සේ අලවා තබා තිබෙන හැඩයක ඉදිරිපස පෙනුම පමණකි. රූපයේ ඇති ආකාරයට අලවා තිබෙන ඝනකාභ ගොඩෙහි තිබිය හැකි මුළු මුහුණත් ගණන කීය ද?



1. 22
2. 23
3. 24

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය